විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

1979 අංක **53** දරණ පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ජාතියේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම් දරණ ආයතනය වේ. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කොමිසම වර්තමානයේ කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

කොමිසමේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර - කාර්යාල කාර්ය සහයක (තනතුරු 01)- කොන්ත්‍රාත් පදනම මත

අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් වත් සමත් වී විභාගයට පෙනී සිටීම.

තනතුරට පැවරෙන කාර්යයන්

- ඉහළ නිළධාරීන්ගේ කාර්යයන් සඳහා මූලික සහායක කටයුතු
- කාර්යාල පිරිසිදු කිරීමේ කටයුතු
- යන්ත්‍ර ක්‍රියා කිරීමේ කටයුතු
- ලිපි / පාර්සල් / ලිපි ගොනු ආදිය බෙදාහැරීමේ කටයුතු
- කාර්යාලය විවෘත කිරීම/වැසීම ආදියේදී යතුරු රාජකාරි

සියල්ල ඇතුලත් මාසික දීමනාව රු.38488.00 +17800.00= **රු.**56288.00

අමතර ප්‍රතිලාභ -

සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට පිළිවෙලින් **15%** හා **3%** දායකත්වයක් ලබා දේ.

වයස් සීමාව -

අවුරුදු **22 – 45** ත් අතර විය යුතු වේ.

සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමේ ක්‍රමය : අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම්, අදාළ පළපුරුද්ද, වෘත්තීය ප්‍රවීණතා/ වෙනත් සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව මත රඳා පවතී.

තමන් විසින් සකස් කර ගන්නා ලද ජීව දත්ත තොරතුරු සහිත ඉල්ලුම්පත් **2026.11.20 වන දිනට හෝ ඊට පෙර** පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය සමඟ සියලුම සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත බහාලන ලියුම් කවරයේ **වම්පස ඉහළ කෙළවරේ** අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

කොමසාරිස්
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
05 වන මහල,
“ මෙහෙවර පියෙස **”** ගොඩනැඟිල්ල,
කොළඹ 05.
www.slic.gov.lk
011-2676645

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED